සුනිල් හඳුන්නෙත්ති,
අංක 464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

2024.08.29

අධ්‍යක්ෂක,

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,

කොළඹ 01.

අධ්‍යක්ෂකතුමනි,

**ෆේස්බුක් ගිණුම් ගණනාවක පලකර තිබූ ව්‍යාජ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙනි.**

මා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන අතර ජාතික ජන බලවේගයේ ජාතික විධායක කමිටු සාමාජිකයෙක් ද වෙමි. අප පක්ෂයේ නායක මෙන්ම ඉදිරි ජනාධිපතිවරණයේ අප පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා ද වන පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතාගේ නමින් නිකුත් කර ඇති ව්‍යාජ ලිපියක් සම්බන්ධව ඔබ ආයතනය වෙත ඔහු සහ ජාතික ජන බලවේගය වෙනුවෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කරන මෙන් මා වෙත ලැබී ඇති උපදෙස් මත මෙම පැමිණිල්ල ඉදිරිපත්කර සිටිමි.

යම්කිසි පුද්ගලයෙක් සහ/හෝ පුද්ගල කණ්ඩායමක් විසින් අප පක්ෂයේ ලිපි ශීර්ෂය කූඨ ලෙස යොදා ගනිමින් දින රහිතව "**සංඝ සමුළුවෙන් පසු පැතිර යන දුර්මත සම්බන්ධවයි**" යන මාතෘකාව යටතේ සියලුම ප්‍රධාන ධාරාවේ මාධ්‍ය ප්‍රධානීන් අමතා සකස් කර ඇති එකී ලිපිය මගින් මාලිමා රජයක් යටතේ කිසිදු ආගමකට ප්‍රමුඛත්වය නොලැබෙන බවත්, ඒ සම්බන්ධ අපගේ ප්‍රතිපත්ති වල කිසිදු වෙනසක් සිදුවී නොමැති බවත්, අප පසුගාමී ජාතියක් බවට පත් කරන ප්‍රධාන හේතුවක් ලෙස සලකන ආගම හා රාජ්‍ය අතර දුරස්ථභාවය තබාගැනීම අපගේ ප්‍රතිපත්තිය වන බවත් එකී ව්‍යාජ ලිපියේ දක්වා ඇත. එහි පහළින් අනුර කුමාර දිසානායක යනුවෙන් ව්‍යාජ අත්සනක් ද යොදා ඇත.

තවද මෙම ව්‍යාජ ලිපිය සිරස මාධ්‍ය නාලිකාවේ 2024.08.24 වන දින ප්‍රවෘත්ති ප්‍රකාශය තුළ විකාශය වූවක් බව හැඟවෙන ආකාරයෙන් එම නාලිකාවේ ලාංඡනයද ව්‍යාජ ලෙස යොදා ගනිමින් සකස් කරන ලද ඡායාරූපයක් ෆේස්බුක් පිටු රාශියක පලකර තිබිණ. එය ඉතා සංවිධානාත්මකව සිදුකරන ලද්දක් වන අතර ඒ බව වඩාත් තහවුරු වනුයේ එම ව්‍යාජ ප්‍රවෘත්තය පලකර තිබූ සෑම ෆේස්බුක් පිටුවකම ඒ සම්බන්ධ විස්තරය ලෙස එකම ආකාරයේ විස්තරයක් එලෙසින්ම පලකර තිබීම හේතුවෙනි. එකී ව්‍යාජ ලිපිය සහිත ව්‍යාජ ලෙස සකස් කරන ලද ප්‍රවෘත්තියේ පිටපතක් සහ එය

පලකර තිබූ ෆේස්බුක් පිටුවල නම් සහ යොමුවල (links) වල ලැයිස්තුවක් මේ සමඟ අමුණා ඉදිරිපත් කර සිටිමි.

මෙම ව්‍යාජ ලිපිය මුළුමනින්ම අනුර දිසානායක මහතා සහ ජාතික ජන බලවේගය මේ වනවිට ලබා සිටින අසීමිත ජනතා ප්‍රසාදය දරාගත නොහැකි පිරිසක් විසින් ඔහු සහ අප පක්ෂය ජනතාව අතර අප්‍රසාදයට, පිළිකුලට සහ වෛරයට ලක් කිරීමේ ද්වේශසහගත අරමුණෙන් චේතනාන්විතවම සකස් කරන ලද්දක් බව කියා සිටිමි. විශේෂයෙන්ම මේ වන විට ගරු සංඝයා වහන්සේලා අතර අනුර දිසානායක මහතා ලබා සිටින විශ්වාසය පළුදු කරමින් ආගම් අතර ගැටුමක් ඇති කිරීම එම ව්‍යාජ ලිපියේ අරමුණ බව පැහැදිලි වේ. එසේ හෙයින් මෙම ව්‍යාජ ලිපිය පිළිබඳ නිසි සහ කඩිනම් විමර්ශනයක් සිදුකර අදාළ අපරාධකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

ස්තූතියි.

මෙයට,

සුනිල් හඳුන්නෙත්ති